# සැලව රජමහා විහාරයේ හායනකාරක හඳුනාගැනීම

ආර්.පී.කේ. ස්වර්ණලතා[1]

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ඡන්ද කොට්ඨාසයේ සැලව ග්‍රාමයේ පිහිටි සැලව රජමහා විහාරය මෙම පළාතේ පැරණිතම ලෙන් විහාර අතරින් එකකි . මෙහි ඉතිහාසය කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයට අයත් වේ . ඉතිහාසය හෙළිදරව් කරන ප්‍රධාන සාධකය ලෙන් විහාර බිත්තියේ නිර්මාණය කර ඇති පර්වත ලිපිය වැදගත් වේ . එය ශ්‍රී ලංකා රාජාවලියේ අවසාන සෙල්ලිපිය සේ සැලකේ. කඳු බෑවුමේ ඇති පර්වතය අභ්‍යන්තරයට හැරිමට ලක්කර නිර්මාණය කරන ලද විහාර සංකීර්ණය කටාර කොටන ලද ලෙන් තුනකින් යුක්තය . මෙම ලෙන් මහනුවර යුගයේ කරවූ බව සෙල්ලිපියේ දක්වා තිබේ. එම යුගයට ආවේනික නෙළුම්මල, මකර තොරණ, ලියපත්, පලාපෙති මෙහි දැකගත හැකිය . මෙම පුරාවිද්‍යා ස්ථානයට බලපෑම් සිදු කරන්නාවූ හායනකාරක භෞතික, රසායනික හා ජීව විද්‍යාත්මක ලෙස වර්ග කළ හැකිය. කළු ගලින් නිර්මාණය කර ඇති මෙම රජමහා විහාරයේ සිතුවම් දුර්වර්ණ වීම, සිතුවම් නිර්මාණය කරන ලද බදාම ස්තරය ගැලවීම වර්තමානය වන විට දක්නට ලැබේ. මෙම තත්ත්වය බුද්ධ ප්‍රතිමාවලට ද බලපෑම් සිදුකර තිබේ.. එමෙන්ම සිතුවම්හි මතුපිට බදාමය ඉරි තැලීමට ද ලක්ව ඇත. ලෙන් විහාරය ඉදිරිපස පියස්ස නිර්මාණයකරණයේ දී යොදන ලද පර්වතයට සම්බන්ධ වන්නාවූ මැටි බදාම ස්තරය ඉරිතැලීමට ලක්ව ඇති ආකාරය නිරීක්ෂණය තුළින් දැකගත හැකිය. මෙම ලෙන් විහාරය නිර්මාණයට යොදා ගන්නා ලද පර්වතය කිහිප ස්ථානයකින්ම කුඩා, මධ්‍ය ප්‍රමාණයෙන් යුත් ඉරිතැලීම් හේතු කරගෙන පර්වතය එක් ස්ථානයකින් වෙන් වීමේ ස්වභාවයක් පෙන්නුම් කෙරේ. එමෙන්ම පර්වතය මුදුනේ මෙන්ම පර්වතයට බද්ධව ද වෘක්ෂලතා වර්ධනය වීම හේතුවෙන් පර්වතය ඉරිතැලීමට ලක්ව ඇත. මෙම හායනයට හේතු ලෙස පාරිසරික තත්ත්වය බලපෑම් කර ඇති බවට උපකල්පනය කළ හැකිය. එනම් ස්වභාවික දිය උල්පත් විහාර සංකීර්ණය ආසන්නයෙන් පිහිටීම හේතුවෙන් ඉහළ අගයක් ගන්නා ආර්ද්‍රතාවයේ බලපෑම ද, අවශ්‍ය ප්‍රමාණයට ආලෝකය ලෙන් සංකීර්ණය අභ්‍යන්තරයට නොලැබී සිතුවම් හායනයට හේතු කාරකයක් වශයෙන් ද පර්වතයට බද්ධව විශාල වන්නාවූ වෘක්ෂලතාවන්හි මුල පද්ධතියේ බලපෑම හේතුවෙන් පර්වතයේ ඉරිතැලීම ආදිය සිදුවී ඇති බවට උපකල්පනය කළ හැකිය. මෙම හායනය සීමා කිරීමට පර්වතයේ පැවැත්මට බලපෑම් කරන්නාවූ වෘක්ෂලතා හැකිතාක් ප්‍රමාණයෙන් ඉවත් කිරීම, දිය උල්පත් ගලායාමේ ස්වභාවය කෘත්‍රිමව වෙනස් කිරීම මගින් ආර්ද්‍රතාවය පාලනය ද ලෙන් සංකීර්ණයට කෘත්‍රිමව ආලෝකය ලබාදීම ද සිදුකළ හැකි ක්‍රියාවන් ලෙස පෙන්වාදිය හැකිය. .

ප්‍රමුඛ පද : ලෙන් විහාර , හායනකාරක , මහනුවර යුගය

---

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.kumududuni2@gmail.com